**ශීර්ෂය 224 ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමණාකරන විගණන වාර්තාව 2022 ජූලි මස 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ විගණන මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු.3,301,895 ක්වූ ගුවන්යානා කුලී ආදායම් එකතුවක් මගින් දැක්වුණු කුවිතාන්සි පත් 6 ක් එම වර්ෂයේ ආදායම් ලෙස දක්වා නොතිබුණි. | රු.3,301,895 ක්වූ ගුවන් යානා කුලී ආදායම 2021 දෙසැම්බර් මාසයේදී සිදුකරන ලද වාණිජ ගුවන් මෙහෙයුම් වෙනුවෙන් ලද අතර එම මුදල් 2022 ජනවාරි මාසයේදී ගිණුම් ගත කර ඇත. | ප්‍රවර්තන වර්ෂයට අයත් ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ii) 20.03.02.16 ආදායම් ශීර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂයේ ගුවන් යානා කුලී ආදායම් එකතුව හෙලිටුවර්ස් ආයතනයේ වාර්තා අනුව රු.13,402,123 ක් වුවද එය වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල (ACA-F ආකෘතිය) රු.10,574,308 ක් ලෙස ගිණුම්ගත වී තිබුණි. ඒ අනුව එකතුව රු.2,827,815 ක් වූ සමාලෝචිත වර්ෂයේ ආදායම් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | 2021 වර්ෂය තුළදී හෙලිටුවර්ස් ආයතනය මගින් රජයේ ගිණුමට ලබා දී ඇති ගුවන්යානා කුලී ආදායම් රු. 10,100,225 ක් වූ අතර එයින් රු. 3,301,896 ක් වූ ගුවන්යානා කුලී ආදායම්, 2021 දෙසැම්බර් මාසයට අදාළ වන අතර එම මුදල් 2022 ජනවාරි මාසය තුළ ගිණුම්ගත කර ඇත. | - එම - |

**(ආ) මූලධන වියදම්**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශ අනුව මූලධන වියදම් වල ඇතුළත්, මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වියදම රු 1,265,628,114 ක් වූ නමුත් එම අගය ඒසීඒ 6 ආකෘතිය ප්‍රකාරව වර්ෂයේ මූල්‍ය | මූල්‍ය කාර්ය සාධන වාර්තාව අනුව වත්කම් අත්පත් කර ගැනීම් ලෙස දක්වා ඇති වටිනාකම රු. 1,265,628,114 ක් තුළ රු. 285,642,470 ක් 2104 වැය විෂය යටතේ මිලදී | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මාර්ගෝපදේශ වල නිශ්චිතව දක්වා ඇති උපදෙස් හා මග පෙන්වීම් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |

| | | |
|---|---|---|
| නොවන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම රු 935,582,119 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුල රු.330,045,995 ක් වූ මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් හා මිලදී ගැනීම් ඇතුලත් වී නොතිබුණි. | ගැනීමට යෙදුණු කෙරීගෙන යන වැඩවලට අදාළ වියදම් වේ. | |
| (ii) ACA 6 ආකෘතිය ප්‍රකාර 2020 දෙසැම්බර් 31 දිනට නොනිමි වැඩ ලෙස පැවති රු.929,278,775 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගිණුම්වල ගලපා නොතිබුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් 2021.11.26 දින නිකුත් කරන ලද රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/03 හි ඒසීඒ 06 ආකෘති අනුව වාර්තා කර ඇත. | - එම - |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

**-----------------------------**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ඉඩම්වල නව තක්සේරුකරණයට ආදාලව මුල් පිරිවැය ඉවත් කිරීම් "මාරු කිරීම් මගින් ඉවත් කල යුතු වුවත් එකතුව රු.329,000,000 ක් ඒසීඒ 6 ආකෘතිය තුල ඉවත් කිරීම් අපහරණය ලෙස ඇතුලත් කර තිබුණි.ඒ අනුව ඉඩම් ඉවත් කිරීමක් ලෙස සාවද්‍ය හෙළිදරව්වක් ආකෘතිය මගින් අනාවරණය වී පැවතුණි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් මාර්ගගත ක්‍රමය යටතේ වත්කම් සටහන් කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංගයන් තුල එකතු කිරීම් සඳහා හෝ අදාළ වටිනාකම් මාරු කිරීමක් ලෙස ඇතුළත් කිරීම සඳහා අවශ්‍ය යාවත්කාලීන කිරීම් සහ පහසුකම් ලබා දී නොමැති වීම මේ සඳහා හේතු විය.එම අඩුපාඩුව පිළිබද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මාර්ගෝපදේශ වල නිශ්චිතව දක්වා ඇති උපදෙස් හා මඟපෙන්වීම ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |
| (ii) සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට අධිකාරී බලය ලබා ගැනීමෙන් තොරව කඩා ඉවත් කර තිබූ ගොඩනැගිලි 08 ක මුල් පිරිවැය රු.20,594,200 ක් ඒසීඒ 6 ආකෘතිය තුල ගොඩනැගිලි ශේෂයන් ඉවත් කල යුතු වුවත් 2021 දෙසැම්බර් 31 දිනට පැවති ගොඩනැගිලි අවසන් ශේෂය | සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට මුල් පිරිවැය රු.20,594,200 ක් වූ ගොඩනැගිලි 8 ක් කඩා ඉවත් කර ඇති අතර මෙම ඉවත් කිරීම් වලට අදාල අනුමැතිය ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යංශය වෙත යොමු කර ඇත. | - එම - |

තුල ඇතුලත්ව පැවතුණි.ඒ අනුව භෞතිකව නොමැති වත්කම් ඒසීඒ 6 ආකෘතිය මගින් හෙළිදරව් වී පැවතුණි.

### 1.6.2 විගණන සාක්ෂි නොවීම
-------------------------

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාන මාරු වී ගිය, ස්ථාන මාරුවී පැමිණි, මියගිය හා විශ්‍රාම ගිය හා සේවය හැර ගිය, නිලධාරීන්ගෙන් ණය ශේෂ ඇතුලත් ණය ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව වර්ෂ 05 කට අධික කාලයක සිට පැවති එකතුව රු.9,707,517 ක්වූ හිග ණය ශේෂ සනාථ කර ගැනීමට විගණනයේදී නොහැකි විය. | දෙපාර්තමේන්තුව තුළ මේ සඳහා ලේඛන සකස් කර නොතිබුන අතර මේ වන විට ලේඛන සකස් කර ඇත.ඉදිරියේදී මෙම අඩුපාඩුව සම්පූර්ණයෙන් මඟ හැරෙනු ඇත. | රජයේ නිළධාරීන්ගේ කල් ඉකුත් වූ හිඟ ණය ශේෂයන් නිවැරදිව පෙන්නුම් කරන ලේඛණ යාවත්කාලීනව පවත්වාගත යුතු වීම හා අයකර ගැනීමට කටයුතු කිරීම. |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 ආදායම් කළමනාකරණය
---------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 85 (1) (ඇ) ප්‍රකාර ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් තාත්විකව හා නිවැරදි ලෙස ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරීන් කටයුතු කල යුතු වුවත් ආදායම් ශීර්ෂ 20.03.02.16 - ගුවන්යානා කුලී ආදායම් ඇස්තමේන්තුව සමාලෝචිත වර්ෂයේ මෙන්ම ඉකුත් වර්ෂ 05 ක් තුල සියයට 33 සිට සියයට 91 දක්වා නැවත අවකරණය කර සංශෝධනය කර තිබුණි. ඉකුත් වර්ෂ 05 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තු වල සිදුකර තිබුණු අවකරණය සියයට 91 ක් බව නිරීක්ෂණය විය. | ඉදිරියේදි ඇස්තමේන්තු වඩාත් තාත්වික ලෙස සකස් කිරීමට පියවර ගනු ලබන අතර මෙයට හේතු වූයේ ගුවන්යානා ප්‍රමාණය සීමා වීම, අඩු පිරිවැය සහිත ගුවන් සේවා පෞද්ගලික ආයතන බිහිවීම, කොවිඩ් 19 වසංගත තත්ත්වයයි. | ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් තාත්වික සහ නිවැරදි ලෙස ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කල යුතු වීම හා එම අදායම අයකර ගැනීමට කාලීන හා කාර්යක්ෂම වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතු වීම්. |

| | | |
|---|---|---|
| (ආ) ආදායම් ශීර්ෂ 20.03.02.16 - ගුවන් යානා කුලී ආදායම් ඉපැයීම අනුව 2016 සිට සමාලෝචිත වර්ෂය දක්වා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික ශුද්ධ ආදායම් ඉපැයීම ක්‍රමයෙන් අඩුවීමේ අයහපත් තත්ත්වයක් පැවතිණි. එය 2016 වර්ෂයට සාපේක්ෂව සියයට 24 සිට සියයට 94 දක්වා ආදායම් ඉපැයීම අහිතකර අවකරණයකින් යුතුව විචලනය වී තිබුණි. | 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගුවන්යානා කුලී ආදයම් ක්‍රමයෙන් පහත වැටීමට මූලිකම හේතුව වන්නේ, ගුවන්යානා ප්‍රමාණය සීමා වීම, අඩු පිරිවැය සහිත ගුවන් සේවා පෞද්ගලික ආයතන බිහිවීම, කොවිඩ් 19 වසංගත තත්ත්වයයි | ආයතනය විසින් ලැබිය යුතු අදායම් ලබා ගැනීමට නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර ඒවා නියමිත පරිදි ලබාගැනීමට කටයුතු කල යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

-----------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී හැකිතාක් දුරට සම්පූර්ණව හා නිවැරදිව පිළියෙල කිරීමට ගණන්දීමේ නිලධාරි වගබලා ගත යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් පරිපූරක ඇස්තමේන්තු මගින් අතිරේකව ප්‍රතිපාදන සපයා ගැනීමට මෙන්ම මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ ප්‍රතිපාදන මාරු කර ගැනීමටද සිදුවී තිබුණි. ඒ අනුව පුනරාවර්තන වැය විෂයයන් 2 ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක මුල් ඇස්තමේන්තු සීමාව පරිපූරක ඇස්තමේන්තු මගින් සියයට 3.9 සිට 140 දක්වා එනම් රු.7,000,000 සිට රු.3,196,256,600 ක් දක්වා අගයකින් වැඩිකරගෙන තිබුණි. | පුනරාවර්තන වැය විෂයන් දෙකක අතිරේක ප්‍රතිපාදන කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කල පරිදි අවසන් කිරීමට නොහැකි වීම හා ප්‍රාග්ධන වැය විෂයන් හතරක ලද අතිරේක ප්‍රතිපාදන එකතුව රු.මිලියන 2771 අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අනුව වියදම් කපා හැරීමට කටයුතු කිරීම මේ සඳහා හේතු විය. | මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව ගණන් දීමේ නිලධාරී විසින් වැය විෂයන්ට අදාල වියදම් වල නිවැරදි ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) මුදල් රෙගුලාසි 74 ප්‍රකාරව පරිපූරක ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කාර්යයේ ස්වභාවය හා ප්‍රමාණය මෙන්ම මුළු වියදම හා අතිරේක වශයෙන් ප්‍රතිපාදනය කල යුතු ප්‍රමාණයන් පිළිබද | කෆීර් ගුවන් යානා අලුත්වැඩියාව සඳහා ණයවර ලිපි නිකුත් කිරීමේ ප්‍රමාදය නිසා 2021 වර්ෂයේ සැළසුම්කල පරිදි දෙවන ගෙවීම සිදු නොවීම, කොරෝනා වසංගතය | ආයතනයට අවශ්‍ය අතිරේක ප්‍රතිපාදන නිවැරදිව හඳුනාගෙන මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් කිරීමට අවශ්‍ය මුදල් ලබා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ඇතිකර ගැනීමට කටයුතු කල යුතු |

| | | |
|---|---|---|
| නිශ්චිතව හදුනාගෙන ඒ අනුව සිදුකල යුතුය. මුදල් රෙගුලාසි 78 (3) (ඉ) (ii) ප්‍රකාර මුදල් වර්ෂයේ ඉතිරි කාලය තුල එම කාර්යයට වුවමනා තවදුරටත් වියදම් කිරීමට අවශ්‍ය වන මුදල් සඳහා මුදල් ප්‍රතිපාදන ඇතිකර ගත යුතුය. එසේ වුවද එම නියමයන්ගෙන් පටහැනිව කටයුතු කල නිසා නිශ්චිතව හදුනා ගැනීමකින් තොරව පරිපූරක ප්‍රතිපාදන ඉල්ලුම් කිරීම මත සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.3,820,256,600 ක් වූ පරිපූරක ප්‍රතිපාදන 02 ක් අවලංගු කර, ඒ වෙනුවට එකතුව රු.1,810,256,600 ක් වූ පරිපූරක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. ඒ අනුව 2,010,000,000 ක් වූ පරිපූරක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය අවසානයට අහිතකර අයුරින් අවකරණය කර තිබුණි. | හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගැනීමට නොහැකි වීම හේතු මත ලද පරිපූරක ප්‍රතිපාදන වලින් රු.මිලියන 2010 නැවත භාණ්ඩාගාරයට පවරා දීම නිසා මෙම තත්වය ඇති වීම. | වීම |
| (ඇ) වාර්ෂික ඇස්තමේන්තුව අනුව ක්‍රියාකාරී සැලැස්මක්ද ප්‍රසම්පාදන සැලැස්මක්ද සකස් කර එයට අනුව අග්‍රිමය ඉල්ලුම් කර සැලසුම් ක්‍රියාත්මක කල යුතුය. තවද ලද ප්‍රතිපාදන අරමුණුගත කාර්යයන් වෙනුවෙන් යොදවා ගත යුතුය. ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයන් 10 ක් හා පුනරාවර්තන වැය විෂයයන 07 ක් ලෙස වැය විෂයයන් 17 ක් වෙනුවෙන් ලද මුළු ප්‍රතිපාදන එකතු වූ රු.20,488,316,600 ප්‍රතිපාදනයෙන් රු.9,940,088,786 ක් එනම් සියයට 49 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව සැලසුම්කල වියදම් කපා හැරීම, කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතීන් අවසන් නොවීම නිසා තාවකාලිකව අත්හිටුවීම් ආදිය හේතුවෙන් ප්‍රතිපාදන ඌන උපයෝජනය විය | ඇස්තමේන්තු ප්‍රතිපාදන හැකිතාක් අපේක්ෂිත අරමුණු ඉටු වන අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කල යුතු වීම |

| | | |
|---|---|---|
| (ඇ) මූලධන වැය විෂයයන් 06 ක එකතුව රු.3,705,500,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර සම්පූර්ණයෙන්ම සියයට 100 කින්ම ඉතිරිව පැවතුණි.ඉන් වැය විෂයයන් 04 ක රු.1,231,500,000 ක් වූ ප්‍රතිපාදන වාර්ෂික ඇස්තමේන්තුව මගින්ද වැය විෂයයන් 02 ක රු.2,474,000,000 ක් වූ ප්‍රතිපාදන පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන මගින්ද ලබාගෙන තිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය, අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යටතේ සැළසුම්කල වියදම් කපා හැරීම, පාකිස්තාන ණය යෝජනා ක්‍රමයට අදාල උපදෙස් නොලැබීම, ගුවන් යානා 3 ක අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය අවලංගු කිරීම ආදී හේතු නිසා ප්‍රතිපාදන පූර්ණ වශයෙන් උපයෝජනය නොකර තිබුණි. | - එම - |

**2.3** **බැදීම් හා බැරකම්**

**----------------------**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශනයේ සටහන (iv) මගින් ඉදිරිපත් වූ බැරකම් පිළිබද ප්‍රකාශය අනුව මුදල් රෙගුලාසි 94 (2) ප්‍රකාරව වැය විෂය අංක 224-1-3-1205 සදහා එළඹිය හැකි උපරිම බැදීම් සීමාව රු.135,240,833 ක් වුවද එහි බැදීම් හා බැරකම් වටිනාකම රු.393,875,916 ක් විය. ඒ අනුව රු.258,635,033 කින් උපරිම බැදීම් සීමාව ඉක්මවා බැදීම් හා බැරකම් වලට එළඹ තිබුණි. | සීමාව ඉක්මවා බැදීම් වලට එළඹීමට හේතු වී ඇත්තේ විදේශයන්ගෙන් පතොරම්, රසායනික ද්‍රව්‍යයන් EJECTION SEAT CARTRIDGES වැනි ද්‍රව්‍යයන් ගෙන්වීමේදී ප්‍රසම්පාදන කටයුතු සදහා දීර්ඝ කාලයක් ගතවීමට මුහුණ පෑමට සිදුවන ගැටළු නිසා මෙන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදා පාලනයෙන් තොර කරුණු නිසා 2021 වර්ෂයේ බැදීම් සිදුකර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමට නොහැකි වීම. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මාර්ගෝපදේශ සහ මුදල් රෙගුලාසි වල නිශ්චිතව දක්වා ඇති උපදෙස් හා මහපෙන්වීම් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වීම. |
| (ආ) ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් හා Israel Aerospace Industries Ltd නැමැති විදේශ ආයතනය සමග 2021 මැයි 02 දින ඇති කරගත් ගිවිසුමට අනුව කෆීර් යානා 05 ක් අළුත්වැඩියාවට අදාලව ගිවිසුම්ගත වටිනාකම වූ ඇ.එ.ජ. ඩොලර් 49,570,057 කින් සමාලෝචිත වර්ෂයේදී ඇ.එ.ජ. ඩොලර් 7,435,508 ක් (රු.1,509,408,124 ක්) ගෙවීම් කර තිබුණි. 2021 දෙසැම්බර් 31 | 2021 වර්ෂයේ ගෙවීමට තිබුණු ප්‍රමාණය පමණක් වැය විෂයේ බැදීම කර ඇත. ඉතිරිය 2022 වර්ෂයට බැදීම් කර ඇත. අදාල කෆීර් ගුවන් යානා 5 ක අලුත්වැඩියා ගෙවීම් මුදල් කොටස් වශයෙන් වසරින් වසර ලැබෙන නිසා බැරකම් ලෙස සටහන් කිරීම අවශ්‍ය නොවේ. | සමාලෝචිත වර්ෂයට අදාල සියළු බැරකම් හා බැදීම් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බැදීම් හා බැරකම් ප්‍රකාශය තුල ඇතුලත් කල යුතු වීම. |

දිනට ඉතිරි බැදීම් බැරකම වූ ඇ.එ.ජ.ඩොලර් 42,134,549 (රු.8,511,178,898) බැදීම් හා බැරකම් ප්‍රකාශ තුල ඇතුලත් වී නොතිබුනි.

## 2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම

----------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාලව එකතුව රු.15,738,441 ක් වූ හිග ණය ශේෂයක් පැවතුන අතර මෙම මුළු හිගහිටි ණය ශේෂයෙන් සියයට 96 ක් එනම් රු.15,048,421 ක් වූ ණය ශේෂ සිවිල් අංශයේ නිලධාරීන්ගේ හිග හිටි ණය ශේෂ විය. | හිග ණය ශේෂ අයවීමට අවශ්‍ය කටයුතු ලිපි යැවීම, ප්‍රාදේශීය ලේකම් මගින් වත්කම් වාර්තා කැදවීම, මැතිවරණ කාර්යාල මගින් ලිපිනයන් හදුනා ගෙන ලිපි යැවීම ආදි කටයුතු සිදු කරන ලදී. කිසිදු ප්‍රතිචාරයක් නැති ණය සදහා නීතිපතිගෙන් උපදෙස් ලබා ගැනීම,හිඟ හිටි දේපල ණය සදහා නීති මාර්ගයෙන් කටයුතු කිරීම සියළු කටයුතු අවසානයේ ණය ශේෂ කපා හැරීමට සලකා බැලීමේ කටයුතු කිරීම, මියගිය විශ්‍රාම ගිය නිලධාරින්ගේ තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම මගින් ගිණුම් ගත නොවූ ගෙවීම් ගිණුම් ගත කිරීම ආදිය සිදුකර ඇත. | නිළධාරීගෙන් අයවිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයක් සකස් කර ණය තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම කල යුතු වීම. |
| (ආ) ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4 වගන්තියේ සදහන් පරිදි සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු අත්තිකාරම් ශේෂ අයකර ගත නොහැකි අවස්ථාවන් තුලදී ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කාරයින්ගෙන් අයකර ගැනීමට නීතිමය කටයුතු කල යුතු වුවත්, එම නියමයන්ට අනුව කටයුතු නොකර මියගිය/විශ්‍රාම ගිය/සේවය හැර ගිය සිවිල් නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය වූ රු.15,738,441 ක් හිග | හිග ණය ශේෂ අයවීමට අවශ්‍ය ලිපි යැවීම, ප්‍රාදේශීය ලේකම් මගින් වත්කම් වාර්තා කැදවීම, මැතිවරණ කාර්යාල මගින් ලිපිනයන් හදුනාගෙන ලිපි යැවීම, ආදි කටයුතු සිදු කරන ලදී. කිසිදු ප්‍රතිචාරයක් නැති ණය සදහා නීතිපතිගෙන් උපදෙස් ලබා ගැනීම, නීති මාර්ගයෙන් කටයුතු කිරීම, සියළු කටයුතු අවසානයේ ණය ශේෂ කපා හැරීමට සලකා බැලීමේ කටයුතු කිරීම, මියගිය විශ්‍රාම ගිය | නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කාර්යක්ෂම හා ඵලදායී ක්‍රමවේදයක් සකස් කර ණය තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම කල යුතු වීම |

| | |
|---|---|
| ණය ශේෂ ලෙස දක්වා තිබුණු අතර ඉන් වර්ෂ 05 ට වැඩි කාලයක් හිඟහිටි ණය ශේෂය රු.9,707,517 ක් විය. | නිලධාරින්ගේ තොරතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීම මගින් ගිණුම් ගත නොවූ ගෙවීම් ගිණුම් ගත කිරීම ආදිය සිදුකර ඇත. |

## 2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

------------------------------

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශන පරීක්ෂාවේදී බැංකු ජංගම ගිණුමක එකතුව (ඇ.එ.ජ. ඩොලර් 1,393,866.83) රු.281,561,099 ක් වටිනා හඳුනා නොගත් තැන්පත් ශේෂයන් 5 ක් පැවතුණු අතර එයින් (ඇ.එ.ජ. ඩොලර් 264,450) රු.53,418,900 ක් වටිනා තැන්පතු 2022 මාර්තු 25 දින වන විටත් හඳුනාගෙන නොතිබුණි. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විදේශ ව්‍යවහාර බැංකු ගිණුමේ බැර වූ විදේශ මුදල් (ඇමරිකානු එක්සත් ජනපද ඩොලර්) සම්බන්ධයෙන් වාර්තාවක් එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් මේ වන තෙක් ලැබී නොමැති අතර අදාළ මුදල් බැර වීම් සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය හරහා එක්සත් ජාතීන්ගේ සංවිධානය දැනුවත් කර ඇත. | බැංකු ප්‍රකාශන වල හඳුනා නොගත් බැරවීම් කඩිනමින් හඳුනාගෙන ගිණුම්වල ඇතුලත් කල යුතු වීම. |

## 2.6 නීතිරීති රෙගුලාසි වලට අනුකූල නොවීම

---------------------------------------------

| නීතිරීති යොමුව | නිරීක්ෂණය | ගණන් දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) 128 1 (ආ) | රජයට අයවිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ගණන්දීමේ නිලධාරි කටයුතු කල යුතුය. එසේ වුවත් කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ නිලධාරි පදිංචි නිවාස 316 ක ආර්ථික කුළිය අයකිරීමේදී තක්සේරු දෙපාර්තමේන්තමේන්තුව විසින් තක්සේරු කල | නව තක්සේරු වාර්තාවක් 2021 දෙසැම්බර් 15 දිනට ලබාගෙන නිසි කටයුතු සඳහා වැටුප් හා ලේඛණ අංශයට 2021 -12-31 දින යොමු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයට අය විය යුතු ගාස්තු නිශ්චය කිරීමට ගණන් දීමේ නිළධාරීන් කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | වටිනාකම සඳහා වූ වලංගු කාලය ඉක්මවා ගොස් තිබුණි. වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැරණි තක්සේරුව මත කුලී අයකර තිබුණි. | | |
| (ii) 128 (2) ඉ | ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රාජ්‍ය ආයතන 10 කින් හා පෞද්ගලික ආයතන 02 කින් එකතුව රු.12,674,073 ක ගුවන් යානා කුලී ආදායම් වර්ෂ 3 ත් 18 ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව හිඟ හිටව පැවතුණි. | පොත් වලින් ඉවත් කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා ඇත. පිළිතුර ලෙස අදාල අමාත්‍යාංශ ලේකම්වරු කැඳවා තවදුරටත් සොයා බලන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කර ඇත. හිඟහිටි අදායම් පොත් වලින් ඉවත් කිරීමට සිහි කැඳවීම් ලිපිය ආරක්ෂක අමාත්‍යාංශ වෙත යොමු කර ඇත | ආදායම් ගණන් දීමේ නිළධාරී විසින් රජයට ලැබිය යුතව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීමට කාර්යක්ෂම වැඩ පිළිවෙලක් සකස් කල යුතු වීම. |
| (iii) 231 (1) | හැකිතාක් දුරට වෙනත් ලේඛනයක් නොබලා හරි වැරදි බැලීමට හැකිවන පරිදි සියළු විස්තර ගෙවීම් වවුචරය තුල ඇතුලත් විය යුතු වුවත් එම නියමයන්ගෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 21 කදී ගෙවා තිබුණු එකතුව රු.4,566,882 ක්වූ සංග්‍රහ වියදම් වෙනුවෙන්, වැය ශීර්ෂ 224-1-2-1203 මගින් Officers' Mess වෙත ගෙවා තිබුණි. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සංග්‍රහ කටයුතු සිදු කිරීමේදී ආරක්ෂාව හා රහස්‍යභාවය වැනි හේතු මත මෙම තත්ත්වය පැවතුණි. 2021 අගෝස්තු සිට මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් වවුචර් තුල ඇතුලත් විය යුතු සියළු විස්තර ඇතුලත් විය යුතු වීම. |
| (ආ)ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 5.2 ඡේදය | උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකමක් නැති විවාහක නිලධාරීන් හට වැටුපෙන් සියයට 12 ½ ක් අයකරගත යුතු වුවත් | ආරක්ෂක අමාත්‍යාංශයේ D/520/ET/11/3 2006 දෙසැම්බර් 14 දිනැති ලිපිය අනුව විවාහක නිවාසයන්හි පදිංචි සේවා | ආයතන සංග්‍රහයේ විධි විධාන වලට අනුව රජයට අයවිය යුතු ගාස්තු නිශ්චිතව හඳුනාගෙන රජයේ ආදායමට ඇතුලත් |

| | | |
|---|---|---|
| කොළඹ ගුවන් හමුදා කඳවුර සහ කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරට අදාල නිලධාරි නිවාස කුලි අයවීම ඒ අනුව සිදුවී නොතිබුණි. ඒ අනුව එම නියමයන්ගෙන් බැහැරව උපලේඛනගත නිවාස හිමිකමක් නැති නිළධාරීන් හට ආර්ථික කුලිය සියයට 10 අයකිරීම හේතුවෙන් ගුවන් හමුදා කොළඹ කඳවුරේ නිලධාරි නිවාස 221 ක් වෙනුවෙන් 2021 වර්ෂය තුල රු.3,626,103 ක් වූ නිවාස කුළී ආදායම් රජයට අහිමිවී පැවතුණු අතර කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ නිවාස 302 ක් වෙනුවෙන් 2021 වර්ෂය තුල රු.12,635,218 ක්වූ නිවාස කුලි රජයට අහිමි වී තිබුණි. | පුද්ගලයන්ගේ මූලික වැටුපෙන් සියයට 10 ක් නිවාස කුලිය අයකරන ලදී. | කල යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 ප්‍රසම්පාදනයන්

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සංවත්සරය සඳහා අදාල දේශීය/විදේශීය නිලධාරීන්ට හෝටල් නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් රු.5,256,425 ක් SLAF Command Welfare අරමුදලින් ගෙවා පසුව ගුවන් හමුදා වැය ශීර්ෂයෙන් නැවත ප්‍රතිපූර්ණය කර තිබුණි. එසේ වුවත් මෙම සැපයීම් සේවාව ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කිරීමකින් තොරව සිදුකර තිබුණි. මෙම නිසා ප්‍රසම්පාදනමාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) ප්‍රකාර අදාල සේවාව ලබා ගැනීමේදී අවම පිරිවැයක් යටතේ සේවා සපයා | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සංවත්සරයට විදේශ නියෝජිතයන්ගේ පැමිණීම සනාථ කිරීම දින කිහිපයකට පෙර සිදුවීම, කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත වීමට නොහැකි වීම, ණය පහසුකම් සහිත හෝටල් ලබාගැනීමට නොහැකි වීම,නවාතැන් පහසුකම් සැපයීමේදී ඔවුන්ගේ රුචි අරුචිකම් සැලකිලිමත් විම ආදි හේතුකොටගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත විය නොහැකි විය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති විධි විධාන වලට අනුගත වී ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම සිදු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| ගැනීමට කටයුතු කර ඇති බව විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය. | | |
| (ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 ප්‍රකාර මුළු පිරිවැය ඇස්තමේන්තුව සංශෝධනය ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් අනුමත කල යුතු වුවත් 2020 ජූලි 07 දින ගුවන්පුර රෝහලට රු.1,125,000 ක් වටිනා Diathermy යන්ත්‍රය මිලදී ගැනීමේදී රු.900,000 ක් වූ මුල් පිරිවැය ඇස්තමේන්තුව තාත්විකව පිළියෙල නොකිරීම නිසා රු.1,125,000 ක් ලෙස සංශෝධනය කර ප්‍රසම්පාදන කමිටු සාමාජිකයන්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ප්‍රසම්පාදන කමිටු සභාපතිගේ අනුමැතියෙන් පමණක් සිදුකර තිබුණි. | ප්‍රසම්පාදන ඉදිරි කටයුතු කඩිනමින් සිදුකිරීම වෙනුවෙන් සභාපතිගේ අනුමැතිය මත ක්‍රියාත්මක කර පසුව කමිටු සාමාජිකයිගේ අනුමැතිය ලබාගත් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති විධි විධාන වලට අනුගත වී ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම සිදු කල යුතු වීම . |
| (ඇ) 2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 37 කදී විදේශීය අළුත්වැඩියාවන් වෙනුවෙන් යවා ඇති නව මිලදී ගැනීම්, අළුත්වැඩියා වටිනාකම, සුන්බුන් වටිනාකම ලෙස පිළිවෙලින් ඇ.එ.ජ.ඩොලර් 536,000, ක් ඇ.එ.ජ.ඩොලර් 130,525.28 සහ ඇ.එ.ජ.ඩොලර් 91,821.80 ලෙස එකතුව ඇ.එ.ජ.ඩොලර් 758,347.08 ක් (රු. 153,183,110.16 ) ගෙවා තිබුණි. එසේම ගුවන්යානා අමතර කොටස් 64 ක් හා වටිනාකම සඳහන් නොවූ ගුවන් යානා අමතර කොටස් 07 ක් වර්ෂ 7ත් 17 ත් අතර කාලයක සිට ගුවන් හමුදාවට නැවත ලැබී නොතිබුණි. | ප්‍රසම්පාදන අනුමැතියකින් යුතුව ගුවන්යානා අමතර කොටස් යවා ඇත. පරීක්ෂණ අධිකරණයක් වෙත නිර්දේශ සඳහා ඉදිරිපත් කර ඇත. නිර්දේශ අනුමත වු පසු නිසි ක්‍රියා මාර්ග ගැනීමට නියමිතව ඇත. | විදේශයන් වෙත යවන ලද වත්කම් වල අධීක්ෂණය නිසි පරිදි පවත්වා ගැනීම හා එම වත්කම් අළුත්වැඩියා කර නැවත ලබා ගැනිම සඳහා කාර්යක්ෂම ක්‍රමවේදයක් ක්‍රියාත්මක කල යුතු වීම. |

## 3.2 වත්කම් කළමනාකරණය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ඉන්ධන ගබඩා අංශයේ 2016 සැප්තැම්බර් 22 දින රු.500,000 ක වටිනාකමින් මිලදී ගත් ඉන්ධන බෙදාහරින පොම්ප යන්ත්‍රය කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව වර්ෂ 05 කට ආසන්න කාලයක් නිෂ්කාර්යව ගබඩාවේ රඳවා තිබුණි. එම යන්ත්‍රයේ වගකීම් කාලය 2018 සැප්තැම්බර් 22 වන විට අවසන් වී තිබුණි. | ඉන්ධන බෙදාහරින පොම්ප යන්ත්‍රයක් අක්‍රීය වූ විට ඉන්ධන නිකුත් කිරීම අඛණ්ඩව පවත්වා ගෙන යාම මෙන්ම ඉන්ධන පොම්පයක් අක්‍රිය වුවහොත් ඒ සඳහා විදේශයෙන් ඇනවුම්කර අවශ්‍යතාව සපුරා ගැනීමට අධික කාලයක් ගත වන බැවින් ඕනෑම අවස්ථාවක භාවිතයට ගැනීම සඳහා මෙය කටුනායක ප්‍රධාන තොග ගබඩාවේ රඳවා තබා ඇත. | ආයතන විසින් ලබා ගන්නා වත්කම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ආ) 2015 ජූලි 10 දිනැති අංක 02/205 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 වන ඡේදයේ සඳහන් විධිවිධාන අනුව අපහරණය කල යුතු බවට හඳුනාගන්නා වාහන වසරින් වසර අපහරණය කල යුතු වුවත් එම නියමයන්ගෙන් බැහැරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලික කඳවුර කටුනායක වාහන අළුත්වැඩියා හා අපහරණ අංශය තුල වාහන 61 ක් වසර 06 ක කාලය සිට අපහරණය කර නොතිබුණි. | වාහන 61 අපහරණය කිරමේ මූලික කටයුතු සිදු කර ඇත. මේ වන විට එහි අවසන් වාර්තාව පිළියෙල කරමින් සිටින අතර මෙය කඩිනමින් ආරක්ෂක අමාත්‍යාංශය වෙත භාර දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව නියමිත කාලයේදී අපහරණය කල යුතු වත්කම් නිවැරදිව හඳුනාගෙන අපහරණය කල යුතු වීම. |
| (ඇ) කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරට අදාලව නිලධාරි නිවාස 37 ක් මාස 02 - වර්ෂ 11 ක් අතර කාලයක සිට පදිංචියට නුසුදුසු තත්ත්වයේ අබලන්ව පැවතුණි. ඒ අනුව නිලධාරි නිවාස 37 අබලන්ව පැවතීම මෙන්ම නිලධාරී නිවාසයන් වලට අදාල පොරොත්තු ලේඛනයේ නිළධාරීන් 102 ක් සිටියදී නිවාස අළුත්වැඩියා කර එම නිවාසයන් පදිංචිය වෙනුවෙන් ලබා නොදීමෙන් රජයට අයකර ගත හැකිව තිබුණු එකතුව රු.5,718,900 ක්වූ ගොඩනැගිලි කුලී ආදායම අහිමි වී පැවතුණි. | නිළධාරී නිවාස අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට මෙම කඳවුර මඟින් 2020 සහ 2021 වර්ෂයෙහි A&I වැඩසටහන් සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති නමුත්, මූල්‍ය හිඟතාවයන් නිසා එම යෝජනා සඳහා අනුමැතීන් ලැබී නොමැත. වැඩ සේවා අංශයට අළුත් වැඩියාව සඳහා භාර දී ඇති නිළධාරී නිවාස කිසිවක් සුදුසු පරිදි අළුත්වැඩියා කටයුතු නිමවා භාරදීමක් සිදු කර නැත. | ආයතනය විසින් අළුත්වැඩියා හා ප්‍රතිසංස්කරණ කල යුතු වත්කම් කාර්යක්ෂම ක්‍රමවේදයක් හරහා අළුත්වැඩියා කිරීමට කටයුතු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) මුදල් රෙගුලාසි 128 (1) (ආ) ප්‍රකාරව රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට හා සම්පූර්ණයෙන් අයකර ගැනීමට ගණන්දීමේ නිලධාරි කටයුතු කල යුතුය. එම නියමයන්ගෙන් බැහැරව කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ සහ කොළඹ ගුවන් හමුදා කඳවුරේ රජයේ ගොඩනැගිලි 15 ක් බාහිර පාර්ශවයන්ට ලබාදීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් මාසික කුලිය තක්සේරු කර තිබුණි. එසේ වුවද ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පරිපාලන අධ්‍යක්ෂකගේ උපදෙස් ප්‍රකාරව ගිවිසුම් ගත වටිනාකමින් කොටසක් රජයේ ආදායම ලෙසත් ඉතිරි මුදල් රාජ්‍ය නොවන අරමුදල් (Non Public Fund) වෙතත් බැර කිරීමට කටයුතු කර තිබුණි. එබැවින් 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුල එකතුව රු. 11,596,650 වූ ආදායමක් රජයට අහිමි වී තිබුණි. | ශ්‍රී ලංකා ගුවන් හමුදාව භාහිර පාර්ශවයන් වෙත කුලී පදනම මත ලබා දීමෙන් ලද ආදායම් රජයේ අරමුදලට බැරකර ඇත. තක්සේරු දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද තක්සේරු වාර්තාව අනුව කටයුතු කිරීම අදාල පාර්ශවයන් වෙත දැනුම් දී ඇත.<br><br>අදහස් දක්වා නොතිබුණි | මුදල් රෙගුලාසි ප්‍රකාර රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට හා සම්පූර්ණයෙන් අයකර ගැනීමට ගණන් දීමේ නිළදාරී කටයුතු කල යුතුය. |
| (ඉ) 2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරණ ගුවන් හමුදා නියෝගයේ අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකක වල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල් වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් මෙහයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගි කරගෙන තිබුණි. මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් නොවී පැවති බවද තවදුරටත් නිරීක්ෂණය විය. | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි සහ 2016 ජූනි 24 වන දින පැවැත්වූ රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේ නියෝග ප්‍රකාර ලාභ උපයන ව්‍යාපෘති වල මෙහෙයුම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණ කටයුතු විධිමත් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ. |

## 3.3 පාඩු හා හානි

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 නොවැම්බර් 26 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 2021/3 හි 06 හි සටහන (1) අනුව ඉදිරිපත් කල යුතු පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය (මුරෙ 106/113 යටතේ වන පාඩු) වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය තුල තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට ඇති පාඩු හානි අනාවරණය කල යුතුය.එම නියමයෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මෙහෙයුම් ක්‍රියාකාකම් වලින් ජනිත වූ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට ඇති පාඩු සිද්ධි 154 කට අදාල මුළු එකතුව රු.386,194,141 ක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 102,106,113 යටතට ගැනෙන හානි හෝ පාඩු කිසිවක් 2021 වර්ෂය තුල වාර්තා වී නොමැත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මාර්ගෝපදේශ හා මුදල් රෙගුලාසි වල නිශ්චිතව දක්වා ඇති උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශ පිලියෙල කල යුතු වීම. |
| (ආ) 2021 ඔක්තෝබර් 21 දිනැති මුදල් රෙගුලාසි 109 යටතේ පොතෙන් කපාහැරීමට භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාදී ඇති MI-17(SMH-4415) හෙලිකොප්ටරය ගොඩබෑමේදී අනතුරට පත්වීමට අදාල අලාභය කපා හැරීමේ වටිනාකම රු. 105,255,389 ක් වූ අතර එය හානි පාඩු සටහන (ii) යටතේ මුදල් රෙගුලාසි 109 පොතෙන් කපා හැරීම් ප්‍රකාශය තුල දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 102,106 113 යටතට ගැනෙන හානි හෝ පාඩු කිසිවක් 2021 වර්ෂය තුල වාර්තා වී නොමැත. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ මාර්ගෝපදේශ හා මුදල් රෙගුලාසි වල නිශ්චිතව දක්වා ඇති උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශ පිලියෙල කල යුතු වීම. |

## 3.4 අනාර්ථික ගණුදෙනු

------------------------

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1999 සිට 2014 වර්ෂය දක්වා මිලදී ගෙන තිබුණු ඒකක 198 ක්වූ ටයර් භාවිතයට යොදා ගන්නා වාහන දැනට ගුවන් හමුදාව සතුව නොමැති බැවින් අධ්‍යනයකින් තොරව ප්‍රමාණය ඉක්මවා මිලදී ගැනීම හේතුවෙන් ටයර් ටියුබ් ගබඩාවල වර්ෂ 7 ත් 22 ත් අතර කාල පරාසයක් තුල ටයර් සහ ටියුබ් ඉතිරි වී ඇති බව අනාවරණය වේ. | අපහරණය කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයට ඇතුළත් කර ඇති අතර එම සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුමැතිය සඳහා යොමුකර ඇත. | ආයතනයට භාණ්ඩ මිලදී ගැනීමේදී අවශ්‍යතාවය අනුව මිලදී ගැනීමට කළමණාකරනය විසින් කටයුතු කල යුතු වීම. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

----------------------------

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ඉන්ධන අංශයේ 2021 දෙසැම්බර් 06 දින ඉන්ධන තොග අයිතම් 04 ක භෞතික ශේෂය එදිනට පරිගණක මෘදුකාංග පද්ධතියේ (EPASS) පැවති ශේෂය සමග සැසඳීමේදී ණය පදනම මත නිකුත් කරන ඉන්ධන තොග පරිගණක මෘදුකාංගයට ඇතුලත් නොවීම හේතුවෙන් එකතු වටිනාකම රු.29,451,200 ක්වූ ඉන්ධන ලීටර් 222,944 ක ප්‍රමාණයකින් එනම් සියයට 48 සිට සියයට 1137 කින් පරිගණක පද්ධතියේ තොග ශේෂය අහිතකර ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | ගුවන් යානා ඉන්ධන හා මෝටර්රථ ඉන්ධන නිකුත් කිරීම පරිගණක මෘදුකාංග පද්ධතිය මගින් දෛනිකව සිදු නොවන බැවින් මෙම වෙනස පවතී. | පරිගණක පද්ධතියක් මගින් කටයුතු කිරීමේදී සියළුම දත්ත පරිගණකයට ඇතුලත් කර පද්ධතිය යාවත්කාලීන කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කොළඹ කඳවුරේ ගොඩනැගිලි බාහිර පාර්ශවයන්ට කුලියට ලබාදීම සම්බන්ධ 2016 ජුනි 10 දිනැති රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තක්සේරුකරුගේ අංක CM/CMC/RP/666,668,669 දරන තක්සේරු වාර්තාවේ වලංගු කාලය වසර 3 කින් අවසන් වන බව සඳහන්ව ඇති අතර ඒ අනුව 2016 ජුනි 10 දිනෙන් පසුව වර්ෂ 6 ක කාල ප්‍රමාදයකින් යුතුව නැවත ගොඩනැගිලි කුලී තක්සේරුවක් නොකර එම ගොඩනැගිලි කුලී අයකර ගෙන තිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යැවූ ලිපි 6 ක යොමු දක්වා ඇත. ශ්‍රී ලංකා ගුවන් හමුදා කොළඹ කඳවුරේ ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා ලිපි 06 මගින් තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇති අතර තක්සේරු කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | ගොඩනැගිලි බාහිර පාර්ශවයන්ට කුලී පදනම මත ලබා දීමේදී ඒවායේ වර්තමාන තක්සේරු අගය පදනම් කරගෙන කුලී අයකිරීමට කළමනාකරනය කටයුතු කල යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථාන ආපන ශාලාවේ ගොඩනැගිල්ල කුලියට දීමට අදාලව රජයේ තක්සේරුව අනුව මාසික වෙළඳපොළ කුලිය රු.115,000 ක් ලෙස තක්සේරු කර තිබියදීත් ගිවිසුම් ගත වීමේදී රජයේ අරමුදලට මාසිකව රු.7,500 ක්ද රාජ්‍ය නොවන අරමුදලට (No Public Fund) රු.7,500 ක්ද ලෙස රු.100,000 ක් අඩුවෙන් රජයට අවාසිදායක වන පරිදි බැර වීම නිසාවෙන් 2021 වර්ෂයේදී රු.1,200,000 ක්වූ ආදායම් රජයට අහිමි වී පැවතුණි. | ගුවන් හමුදා මූලස්ථාන ආපනශාලාව පවත්වාගෙන යනු ලබන්නේ සුබ සාධන මිල ගණන් යටතේ ගුණත්වයෙන් යුත් ආහාර සැපයීම සඳහා වන අතර මේ සඳහා ටෙන්ඩර් කැඳවීමේදී එක් සැපයුමකරුවෙකු පමණක් ඉදිරිපත් වූ අතර අඛණ්ඩව සේවය සැපයීමේ අවශ්‍යතාවය මත ඉදිරිපත් වූ එකම සැපයුම්කරු මගින් ආපන ශාලාව පවත්වාගෙන යන ලදී.මෙහි තක්සේරු අගය රු.115.000 ක මුදලක් බැවින් එම මුදලට ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් නොවීම නිසා මෙම මුදලට ආපනශාලාව අඛන්ඩව පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය මත මෙම මුදලට ලබාදී ඇත. | ගොඩනැගිලි කුලියට දීමේදී විවෘත ටෙන්ඩර් කැඳවා ප්‍රවර්ථන තක්සේරුවට ටෙන්ඩරය ප්‍රදානය කිරීමට කළමණාකරන විසින් කටයුතු කල යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරීලත් නිලධාරීන් අනුමත 2557 ක් වූ අතර ඉන් පුරප්පාඩු 316 ක් පැවතුණි. අධිකාරි නොලත් (සෙසු නිලයන්) නිලධාරීන් අනුමත සංඛ්‍යාව 34,381 ක්වූ අතර ඉන් පුරප්පාඩු 3829 ක් විය. සෙසු නිලයන්ගේ වැඩිම පුරප්පාඩු සංඛ්‍යාවක් එනම් පුරප්පාඩු 2602 ක් නායක ගුවන්භට හා ගුවන්භට තනතුරු සඳහා විය. | නිළධාරින්ගේ සහ සෙසු නිළයන්ගේ කාර්ය මණ්ඩල පුරප්පාඩු නිවැරදි වේ. මෙම පුරප්පාඩු මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට උපකාරී වන ප්‍රසස්ථ සේවක මණ්ඩල පවත්වා ගැනීම උදෙසා පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කර පවත්වා ගත යුතුය. |